දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/13/AT/DRG/2025

ඔබේ අංකය / உமது இல. / Your No.: HA/05/20/01/01/20

දිනය / திகதி / Date: 2026.03.17

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**<u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2025.12.16 දිනැති ලිපිය හා බැඳේ.

02. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය (ඒකාබද්ධ සේවය හැර) සඳහා වන 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු නොකරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකර ඇති ස්ථාන මාරුවීම් නියෝග හා ඊට අදාළ ආවරණ ලිපිය භාවිතා කර 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධාන වලට අනුකූලව එම අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. එසේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන්, එම අධිකාරයේ තීරණය ලැබෙන තෙක් නොසිට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කළ යුතුය.

05. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන්, වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථාන වලින් මුදා හැරීමට කටයුතු කිරීම රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තියේ විධිවිධාන අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර රෙජිස්ට්‍රාර් ජනරාල් හා/හෝ අදාළ ප්‍රාදේශීය කාර්යාල වල අදාළ මාණ්ඩලික නිලධාරීන් විසින් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

Ndayu

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත :
රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - කරු. දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වාර්ෂික ස්ථාන මාරු 2025 අභියාචනා - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | නිලධරයාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 01 | එස්. යෝගෙස්වරන් මිය | රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I ශ්‍රේණිය | වව්නියාව දෙමළ කොට්ඨාශය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය වව්නියාව | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 02 | ජී.එච්.පි. මධුරංගි මිය | රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය II ශ්‍රේණිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය මාතර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිටබැද්දර | අභියාචනය නිශ්ප්‍රභ කර ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2027.01.01 දින ලෙස සංශෝධනය කිරීම |
| 03 | ආර්.එච්.එස්. ප්‍රේමනාත් මහතා | රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය II ශ්‍රේණිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය මාතර | දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය ගාල්ල | අභියාචනය බහා තැබීම. |
| 04 | එස්.එච්.සී.එස්. ද සිල්වා මහතා | රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I ශ්‍රේණිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය ගම්පොල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අඹගමුව කෝරළය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 05 | එස්.එම්.ඩී.එස්.සී. චන්ද්‍රසිරි මිය | රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I ශ්‍රේණිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ශ්‍රී ජයවර්ධනපුරය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය දෙල්කඳ | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 06 | එච්.එල්.එන්.ටී. ලියනගේ මිය | රෙජිස්ට්‍රාර් සේවය IIශ්‍රේණිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය මහනුවර | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය කුරුණෑගල | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 07 | එන්.කේ.බී.ටී.එස්. නරසිංහ මිය | රෙජිස්ට්‍රාර් සේවය IIශ්‍රේණිය | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය කෑගල්ල | ස්ථාන මාරු ලැබී නැත | අභියාචනය ප්‍රතික්ෂේප කිරීම |
| 08 | අයි.එස්. පරණගම මිය | ලේඛන සහකාර | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය පානදුර | ප්‍රධාන කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |